සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ක්‍රිස්තු ධර්මය I
கிறிஸ்தவம் I
**Christianity I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

විභාග අංකය: ...................................

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** යුක්ත වේ.
* I කොටසට අනිවාර්ය ප්‍රශ්න 20 ක් ද II කොටසට ප්‍රශ්න 09 ක් ද ඇතුළත් වේ. I කොටසේ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ම සැපයිය යුතු ය. II කොටසින් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයීම අවසානයේ දී I කොටසට අදාළ පිළිතුරු පත්‍රය II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ **එකට අමුණා** භාර දෙන්න.

## I කොටස

- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** ලියන්න. නිවැරදි පිළිතුර තෝරා, **එහි අංකය, ඉදිරියෙහි ඇති වරහන තුළ** ලියන්න.

The National e-Learning Portal for The General Education

**1.** 1.1 ශුද්ධවූ බයිබලයේ වාචික සම්ප්‍රදායයන්ගෙන් ඉදිරිපත් කෙරෙනුයේ,
(1) ජනවහරයේ සිද්ධීන්වල එකතුවක් ය.
(2) තෝරාගත් ජනතාවගේ අත්දැකීම් ය.
(3) ලිඛිත මාධ්‍ය නොවැදගත් බව ය.
(4) මුල් යුගයේ සාක්ෂරතාවයේ නොහැකියාව ය.
(5) කතාන්තර ශෛලියෙන් ළාබාලයින් දැනුවත් කිරීම ය. (.........)

1.2 ඊර්ෂ්‍යාව නිසා පාපය ව්‍යාප්ත වන බවට උත්පත්ති පොතෙහි සඳහන් නිදසුනක් වන්නේ,
(1) රාකෙල් හා රූත් ය. (2) ජාකොබ් හා ඊසාක් ය.
(3) ආබ්‍රහම් හා අභිමලෙක් ය. (4) ආදම් සහ ඒව ය.
(5) කායින් සහ ආබෙල් ය. (.........)

1.3 ශුද්ධවූ බයිබලයේ නික්මයාම පොත සම්පාදනයේ දී ප්‍රමුඛත්වය දී ඇති සම්ප්‍රදාය වනුයේ කුමක් ද?
(1) යාවේ (2) පූජක
(3) එලොහිම් (4) ද්විතීය නීතිය
(5) වාචික (.........)

1.4 පුරාණ ගිවිසුමේ සෙනග දේව ජනතාවක් වූයේ,
(1) මෝසෙස් පසු පස්සේ ගමන් කළ නිසා ය.
(2) කාන්තාරයේ මන්නා අනුභව කළ නිසා ය.
(3) දස පණත පිළිපදින නිසා ය.
(4) ගිවිසුම් දඟැබ ආරක්ෂා කළ නිසා ය.
(5) ආබ්‍රහම්ගේ පෙළපතින් පැවත එන නිසා ය. (.........)

1.5 ආදම් හා ඒවට වස්ත්‍ර පැළඳවීමෙන් සංකේතවත් කරනුයේ කුමක් ද?
(1) ඔවුන්ගේ මානසික වියවුල් බව
(2) දෙවියන් වහන්සේගෙන් ලැබූ ආඥාව
(3) පාපයේ බරපතලකම අවබෝධවීම
(4) පවිටු මිනිසාට ලැබෙන දේව සංරක්ෂණය
(5) මැවිල්ල දෙවියන් වහන්සේට සමීප වීම (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

1.6 මෙසියානු සාම යුගය ගැන කථා කරන දිවැසිවරයා වනුයේ,
(1) ආමෝස් ය. (2) එසකියෙල් ය.
(3) මීකා ය. (4) හොසියා ය.
(5) ජෙරමියා ය. (………)

1.7 පුරාන ගිවිසුමට අනුව කෙනෙකුට දිවැසිවර කැඳවීම ලැබෙනුයේ
(1) ධර්මිෂ්ඨ ජීවිතය මත ය. (2) ජනතා ප්‍රසාදය මත ය.
(3) දේව කැඳවීම මත ය. (4) ජනතාවගේ යැදුම් මත ය.
(5) පාරම්පරික උරුමය මත ය. (………)

1.8 "ගවයාට උගේ අයිතිකාරයා ගැන දනුමක් ඇත. එහෙත් මාගේ ඉශ්රායෙල් සෙනහට එවැනි දනුමක් නැත." මෙලෙසින් ඉශ්රායෙල් සෙනග දෙවියන් වහන්සේගෙන් ඈත් වීම ගැන ප්‍රකාශ කළ දිවැසිවරයා වනුයේ,
(1) යෙසායා ය. (2) දනියෙල් ය.
(3) එසකියෙල් ය. (4) මීකා ය.
(5) ජෙරමියා ය. (………)

1.9 දේව දර්ශනයට යෙසායා දිවැසිවරයාගේ ප්‍රතිචාරය වූයේ,
(1) ජනතා මෙහෙවරට තමා නො සුදුසු බව කීම ය.
(2) උදසීන ජනතාවට සේවය කිරීමට පසුබට වීම ය.
(3) ජනතා පිළිගැනීම අපේක්ෂා කිරීම ය.
(4) තම ප්‍රබලතාවයන් යොදා ගැනීමට මැලි වීම ය.
(5) තමාගේ හා තම ජනතාවගේ පාපිෂ්ඨ බව පිළිගැනීම ය. (………)

1.10 උපස්ථායකයින් සත් දෙනා පත් කිරීමෙන් බලාපොරොත්තු වූයේ,
(1) සහනාධාර කටයුතු සාර්ථක කර ගැනීම ය.
(2) නව නායකයින් බිහි කර ගැනීම ය.
(3) ගෝලයින්ගේ ගණන වැඩි කර ගැනීම ය.
(4) සභා සේවයේ සහභාගිත්වය පුළුල් කිරීම ය.
(5) යාච්ඤා කණ්ඩායම්වල නායකයින් ඇති කිරීම ය. (………)

1.11 එපීසියේ දී පාවුළුතුමාගේ සමුගැනීමේ අවස්ථාව එපීසයේ ජනතාවට හැඟීම්බර අවස්ථාවක් වීමට හේතු වූයේ,
(1) "ගෙයින් ගෙට යමින් ඔබට මා ඉගැන්වූ බව" මතක් කිරීම නිසා ය.
(2) "තමාගේ මුහුණ යළිත් ඔවුන් නොදකිති"යි ඔහු පැවසූ නිසා ය.
(3) "මට ම මම අගේය කියා මම කිසිසේත් නොසලකමි" යන කීම නිසා ය.
(4) "තුන් වසරක් දිවා රෑ දෙකෙහි කඳුළු සලමින් ඔබට අවවාද අනුශාසනා කළෙමි"යි කී නිසා ය.
(5) "මම ජෙරුසලමට යමි. කුමකින් කුමක් වේ දැයි නොදනිමි . . " කී නිසා ය. (………)

1.12 ජුදා හි සිටි සභා මූලිකයින්ට ආධාර යැවීමට ගෝලයින් තීරණය කිරීමෙන් පැහැදිලි වනුයේ,
(1) ජනතාවගේ සාංඝික ජීවිතය තහවුරු කිරීම ය.
(2) ජනතාව විශ්වාසයේ රඳවා තබා ගැනීම ය.
(3) අන්‍යයන්ගේ අවශ්‍යතාවලට සංවේදී වීම ය.
(4) ගෝලයින්ගේ සම්බන්ධතාවය තහවුරු කිරීම ය.
(5) සභාවට ඇති පක්ෂපාතිත්වය පළුදු නොකර ගැනීම ය. (………)

1.13 මුල් කිතුණු සභාවේ ජනතාව තුළ "ක්‍රිස්තියානි" යන නාමය මුලින්ම ව්‍යවහාර වූයේ,
(1) ජෙරුසලමේ දී ය. (2) රෝමයේ දී ය.
(3) ග්‍රීසියේ දී ය. (4) අන්තියෝකයේ දී ය.
(5) සමාරියේ දී ය. (………)

1.14 දේව රාජ්‍යය උරුම කර ගැනීමට මිනිසා පිළිපැදිය යුතු සත්‍යතාවයන් අන්තර්ගතවී ඇත්තේ,
(1) උත්තම පූජක යාච්ඤාවේ ය. (2) පරමණ්ඩල යාච්ඤාවේ ය.
(3) පරිසිවරුන්ට දුන් අනුශාසනාවේ ය. (4) ශ්‍රී වාක්‍ය හතේ ය.
(5) කන්ද උඩ දේශනාවේ ය. (………)

1.15 හෙරෝද් රජ ජේසුස් වහන්සේගෙන් යම් ආශ්චර්යයක් දකීමට ආශා කළත් උන්වහන්සේ ප්‍රතිචාරයක් නොදැක්වූයේ,
(1) ප්‍රාතිහාර්යයන් දේව රාජ්‍ය විදහා පෑමට පමණක් වූ බැවිනි.
(2) ජනතාව ඉදිරියේ කීර්තිය ප්‍රතික්ෂේප කළ බැවිනි.
(3) දිව්‍යමය දේ හැල්ලුවට ලක් නොකළ යුතු බැවිනි.
(4) තවම සුදුසු මොහොත උදා නොවූ බැවිනි.
(5) හෙරෝද් රජ ඇදහිල්ලේ පිහිටා නොතිබුණු බැවිනි. (………)

[ තුන්වෙනි පිටුව බලන්න.

1.16 ලූක් සුභාරංචියේ සඳහන් පරිදි පිලාත් විසින් ජේසුස් ස්වාමින්වහන්සේ හෙරෝද් වෙතට යවනු ලැබුවේ,
(1) උන්වහන්සේ ගලීලයේ වැසියෙක් වීම නිසා ය.
(2) උන්වහන්සේ දකිම හෙරෝද්ගේ අභිලාෂය වූ නිසා ය.
(3) උන්වහන්සේ එලෙස යවන ලෙස ජනතාවගේ බලපෑම නිසා ය.
(4) පිලාත් හෙරෝද් සමඟ සමාදන වීමට තිබූ ආශාව නිසා ය.
(5) උන්වහන්සේ පිළිබඳ හෙරෝද්ගේ තීරණයේ අවශ්‍යතාව නිසා ය. (………)

1.17 ප්‍රාතිහාර්යයක් ඉල්ලා ජේසුස් වහන්සේ වෙතට පැමිණි ජනතාවගෙන් උන්වහන්සේ බලාපොරොත්තු වූයේ කුමක් ද?
(1) අචල ප්‍රේමය
(2) ගැඹුරු විශ්වාසය
(3) පූර්ණ පරිත්‍යාගය
(4) ස්ථිර බලාපොරොත්තුව
(5) ඇතුලාන්ත වෙනස (………)

1.18 ක්‍රිස්තු අනුගාමිත්වයේ ප්‍රධාන ලක්ෂණය වූයේ,
(1) ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කිරීම ය.
(2) ක්‍රිස්තුස් වහනන්සේට ගෞරව කිරීම ය.
(3) ක්‍රිස්තුස් වහන්සේට ප්‍රේම කිරීම ය.
(4) ක්‍රිස්තුස් වහන්සේව පිළිගැනීම ය.
(5) ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දරීම ය. (………)

1.19 පන්දහසකට ආහාර සැපයීම තුළින් ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයින්ට පෙන්නුම් කරනුයේ,
(1) සාගිනිවූවන්ගේ කුසගින්න නිවාලීම ය.
(2) දේව තේජස විදහා පෑම ය.
(3) ලෞකික ජීවිතයේ පූර්ණත්වය ය.
(4) ආත්මික පෝෂණය සොයායාම ය.
(5) මානව ආදරය පෙන්නුම් කිරීම ය. (………)

1.20 "සුදර්ශන දෙරටුව" ළඟ සිටි කොර මිනිසා සුව කිරීමේ ප්‍රාතිහාර්යය සිදු කළේ,
(1) ජේසුස් වහන්සේ ය.
(2) සභා මූලිකයින් ය.
(3) පාවුළු තුමා ය.
(4) සලමොන් හා තීතස් ය.
(5) අපෝස්තුළුවරුන් ය. (………)

The National e-learning Portal for The General Education

* *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 S I

2926

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ක්‍රිස්තු ධර්මය I
கிறிஸ்தவம் I
Christianity I

* ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## II කොටස

2\. (අ) ආබ්‍රහම්තුමා ජීවත් වූ සමාජ යථාර්ථය ඔහුගේ ධාර්මිෂ්ඨ ජීවිතයට අභියෝගයක් වුවත් එයට ඔහු මුහුණ දුන් අයුරු කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 10 යි)

(ආ) පාළුකරයේ දී දේව ජනතාව අත් දුටු දේව සංරක්ෂණය පසුබිම් කර ගෙන නූතන සමාජ අභියෝග ඉදිරියේ දී ඔබට අනුගමනය කළ හැකි මහ පෙන්වීම් **පහක්** විස්තර කරන්න. (ලකුණු 10 යි)

3\. (අ) "මැවීමේ කතා ඓතිහාසික වෘත්තාන්ත නොව ධාර්මික පණිවුඩයක් අන්තර්ගත කළ වෘත්තාන්තය" මෙය සනාථ කිරීමට කරුණු **පහක්** ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

(ආ) දේව සමානකමට මවන ලද මිනිසාගේ දූත කාර්යය වනුයේ දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධතාවය පවත්වා ගැනීමත් උන්වහන්සේගේ මැවිල්ල සංවර්ධනය කිරීමත් වේ. කරුණු **පහක්** ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

4\. (අ) ගිවිසුම් ජීවිතය පිළිබඳ ව හොසියා හෝ ජෙරමියා යන දිවැසිවරුන් ප්‍රකාශ කළ අයුරු ජේළි **දහයකින්** විස්තර කරන්න. (ලකුණු 10 යි)

(ආ) ජුද පාස්කු මංගල්‍යය ඉශ්‍රායෙල් ජනතාවගේ ජීවිතයේ උතුම් අවස්ථාවක් වූ බව පහත සඳහන් කරුණු පදනම් කරගෙන සනාථ කරන්න. (ලකුණු 10 යි)

(i) නුමුහුන් පූප මංගල්‍යයේ පසුබිම හා තිත්ත පලා අනුභවය.

(ii) ඊජිප්තුවේ කුළුඳුලන්ට පහර දීම හා රතු මුහුදෙන් එතෙරවීම

5\. (අ) නික්මයාම කථාවේ මෝසෙස් තුමාගේ චරිතය තුළින් ඔබගේ ජීවිතයට ලබා ගත හැකි මහ පෙන්වීම් **දහයක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 10 යි)

(ආ) "සීනයි ගිවිසුම ඉශ්‍රායෙල් ජනතාව රාජකීය, පූජක හා ශුද්ධ ජනතාවක් කළේ ය." මෙම ප්‍රකාශය **වචන 120 කින්** පමණ විස්තර කරන්න. (ලකුණු 10 යි)

6\. (අ) ස්නාවක ජුවාම් තුමාගේ සමාජ සාධාරණත්වය සඳහා විවිධ ජන කොටස් වලට එල්ල කළ අභියෝගාත්මක ඉගැන්වීම් කරුණු **පහකින්** පමණ විස්තර කරන්න. (ලකුණු 10 යි)

(ආ) ස්වාමීන් වහන්සේගේ දුක් විඳින සේවකයා තුළින් ප්‍රකාශ වන චරිත ලක්ෂණ **පහක්** ඉදිරිපත් කරමින් ඒ ලක්ෂණ ඔබගේ ජීවිතයට චරිතායතනය කර ගන්නා අයුරු නිදසුන් **පහකින්** ඉදිරිපත් කරන්න. (ලකුණු 10 යි)

7\. (අ) "දේව රාජ්‍යය උරුම කර ගැනීමට අප ගන්නා වෑයම මත අපගේ අවසාන විනිශ්චය සිදුවේ." මෙම කියමන ජේසුස් වහන්සේ වදළ "මහා මංගල භෝජනය" උපමාව පදනම් කරගෙන කරුණු **පහකින්** සනාථ කරන්න. (ලකුණු 10 යි)

(ආ) "දේව රාජ්‍යය යනු සියල්ල කෙරෙහි දෙවියන් වහන්සේගේ අණසක පැතිර විමය." දේව රාජ්‍ය පිළිබඳ ප්‍රාතිහාර්ය **දෙකක්** පදනම් කරගෙන මෙම කියමන සනාථ කරන්න. එක් එක් ප්‍රාතිහාර්ය විස්තර කිරීම සඳහා **වචන 60 ක්** බැගින් භාවිත කරන්න. (ලකුණු 10 යි)

[ පස්වෙනි පිටුව බලන්න.

8. (අ) ශුද්ධ වූ සභාව ශුද්ධාත්ම බලය මත යැපෙන සභාවක් බව අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාකාරිත්වය ඇසුරෙන් සනාථ කරන්න. කරුණු **පහක්** ඇතුළත් විය යුතු ය. (ලකුණු 10 යි)

(ආ) ස්වාමීන් වහන්සේගේ ගෝලයකු වීමේ භාර දූර කම ගැන ලූක් සුවිශේෂයේ සඳහන් ගෝලයින් කැඳවීම ඇසුරෙන් **වචන 120 කින්** පමණ විස්තර කරන්න. (ලකුණු 10 යි)

9. (අ) ක්‍රිස්තු අනුගාමිකයා විසින් ඉටු කළ යුතු මූලික වගකීම් **දෙකක්** උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

(ආ) සීමා රහිතව සමාව දිය යුතු බව "කමා නොවූ දසයා" පිළිබඳ උපමාව පසුබිම් කර ගෙන දෙවි පියාණන්ගේ අසීමිත සමාව **වචන 100 කින්** පමණ විස්තර කරන්න. (ලකුණු 10 යි)

10. (අ) ක්‍රිස්තුස් වහන්සේගේ පාස්කු අභිරහස හා බැඳී පවතින පහත සඳහන් සිද්ධීන් පිළිබඳ ව ලුහුඩු සටහන බැගින් ලියන්න.

(i) පාද දෝවනය
(ii) අන්තිම රාත්‍රි භෝජනය
(iii) ගෙත්සමෙනේ යාච්ඤා කිරීම
(iv) පිලාත් ඉදිරියේ පෙනී සිටීම
(v) ස්වාමීන් වහන්සේගේ උත්ථානය

(ලකුණු 2 × 5 = 10 යි)

(ආ) උත්ථාන වූ ජේසුස් ස්වාමීන්වහන්සේ තම ශ්‍රාවකයින්ට දර්ශනය වූ අවස්ථා **පහක්** ඉදිරිපත් කර එම අවස්ථාවන්හි දී උන්වහන්සේගෙන් ලද පණිවුඩයක් බැගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 10 යි)

* * *

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ක්‍රිස්තු ධර්මය II
கிறிஸ்தவம் II
**Christianity II**

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**විභාග අංකය :** ...................................

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** යුක්ත වේ.
※ I කොටසට අනිවාර්ය ප්‍රශ්න **20** ක් ද II කොටසට ප්‍රශ්න **09** ක් ද ඇතුළත් වේ. I කොටසේ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ම සැපයිය යුතු ය. II කොටසින් ප්‍රශ්න **හතරකට පමණක්** පිළිතුරු සැපයිය යුතු ය.
※ පිළිතුරු සැපයීම අවසානයේ දී I කොටසට අදාළ පිළිතුරු පත්‍රය II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ **එකට අමුණා** භාර දෙන්න.

## I කොටස

● ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** ලියන්න. නිවැරදි පිළිතුර තෝරා, **එහි අංකය, ඉදිරියෙහි ඇති වරහන තුළ** ලියන්න.

1. 1.1 වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව නමැති ප්‍රකාශනයට අනුව නූතන මිනිසාගේ විනාශයට හේතුව වනුයේ,
(1) මෙලොව වස්තූන්ට ආශා වීම ය.
(2) තනිවම ජීවත් වීමට උත්සාහ කිරීම ය.
(3) නිතර විනාශකාරී ක්‍රියාවල යෙදී සිටීම ය.
(4) තම අයිතිවාසිකම් ගැන පමණක් උනන්දුවීම ය.
(5) දේව නීතියෙන් ඈත්වීමට ඇති ආශාව ය. (.........)

1.2 දෙවියන් වහන්සේ මිනිසාට දනය කළ උසස් ම තිළිණය නම්,
(1) දේව සමානකම ය.
(2) ලෝකය තුළ අධිකාරිත්වය ය.
(3) බුද්ධිය ය.
(4) ගවේෂණ ශක්තිය ය.
(5) ස්වභාව ධර්මය ය. (.........)

1.3 යහපත හා අයහපත පිළිබඳ දේව නීතිය සටහන් වී ඇත්තේ ................. තුළ ය. මෙම හිස්තැනට යෝග්‍ය වනුයේ කුමක් ද?
(1) හෘද සාක්ෂිය
(2) මානව දයාව
(3) දේව පූර්ණත්වය
(4) ශුද්ධාත්ම බලය
(5) සර්ව යහපත (.........)

1.4 ශුද්ධාත්ම වරම් මුදලට ගැනීම අයුතු බවට පේදුරුතුමා තරවටු කළේ කාට ද?
(1) කොර්නේලියස්ට ය.
(2) සමාරිය විජ්ජාකාර සයිමන්ට ය.
(3) සපිරාට ය.
(4) තබිතාට ය.
(5) අයිනෙයස්ට ය. (.........)

1.5 ශුද්ධ වූ පාවුළුතුමා පිලිප්පි ලිපියෙන් පෙන්වා දෙන ක්‍රිස්තු ජීවිතයේ කැපී පෙනෙන ගුණාංග වනුයේ,
(1) පිරිසිදුකම හා කීකරුකම ය.
(2) බැහැපත්කම හා ප්‍රේමය ය.
(3) බැහැපත්කම හා කීකරුකම ය.
(4) කීකරුකම හා දිළිඳුකම ය.
(5) යටහත් පහත් භාවය හා එඩිතරකම ය. (.........)

1.6 ශුද්ධ වූ පාවුළුතුමාගේ සංදේශවල සැලැස්ම ඉදිරිපත් කර ඇති අනුපිළිවෙළ වන්නේ,
(1) ආමන්ත්‍රණය, පණිවුඩය, ස්තුතිය සහ අවසානය.
(2) ආමන්ත්‍රණය, යැදුම, ස්තුතිය සහ අවසානය.
(3) ආමන්ත්‍රණය, පණිවුඩය, යැදුම සහ අවසානය.
(4) ආමන්ත්‍රණය, ස්තුතිය, පණිවුඩය සහ අවසානය.
(5) ආමන්ත්‍රණය, යැදුම, පණිවුඩය සහ අවසානය. (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

1.7 ප්‍රේරිතයන්ට පැවරී තිබුණු ප්‍රධාන කාර්යයන් දෙකකි. ඒවා නම්
(1) සහනාධාර බෙදීම හා වැන්දඹුවන් රැක බලා ගැනීම
(2) සංඝ පිහිටුවීම හා සුභසාධක කටයුතු කිරීම
(3) සුභාරංචිය ප්‍රකාශ කිරීම හා පූජා කැඩීම
(4) ගෙයින් ගෙට ගොස් යාච්ඤා කිරීම හා පූජා කැඩීම
(5) රෝගීන් සුව කිරීම හා දුෂ්ඨාත්මයන් දුරු කිරීම (.........)

1.8 කිතුණු සභාවේ මුල් අවධියේ දී පැවැති සේවාධුර වූයේ,
(1) ප්‍රේරිතයින්, තේවාචාරීන් සහ දිවැසිවරුන් ය. (2) දිවැසිවරුන්, ගුරුවරුන් සහ ප්‍රේරිතයින් ය.
(3) පාලකයින්, දිවැසිවරුන් සහ පූජකයින් ය. (4) තේවාචාරීන්, වැඩිහිටියන් සහ පූජකයින් ය.
(5) පාලකයින්, ගුරුවරුන් සහ තාපසයන් ය. (.........)

1.9 ප්‍රධාන සභා පියවරු වනුයේ,
(1) තිබස්හි පාවුළුතුමා, ශුද්ධ වූ ජස්ටින්තුමා සහ ශුද්ධ වූ අගුස්තිනුතුමා
(2) ශුද්ධ වූ ජස්ටින්තුමා, ශුද්ධ වූ ජෙරොම්තුමා සහ තිබස්හි පාවුළුතුමා
(3) ශුද්ධ වූ ජෙරොම්තුමා, තිබස්හි පාවුළුතුමා සහ ශුද්ධ වූ බැසිල්තුමා
(4) ශුද්ධ වූ ජෙරොම්තුමා, තිබස්හි පාවුළුතුමා සහ ශුද්ධ වූ අන්තෝනිතුමා
(5) ශුද්ධ වූ ජස්ටින්තුමා, ශුද්ධ වූ ජෙරොම්තුමා සහ ශුද්ධ වූ අගුස්තිනුතුමා (.........)

1.10 මුල් කිතුණු සභාව තුළ පැන නැගුණු මුල් ම අර්බුදය වූයේ,
(1) පවුල සම්බන්ධව ය. (2) චර්මඡේදනය සම්බන්ධව ය.
(3) නායකත්වය සම්බන්ධව ය. (4) කරිස්මාව සම්බන්ධව ය.
(5) පූජා කැඩීම සම්බන්ධව ය. (.........)

1.11 මිලාන් ආඥාවේ ප්‍රධාන ප්‍රතිඵලය වනුයේ,
(1) කිතු දහම වැළඳ ගන්නා අයට රාජකීය වරප්‍රසාද ලැබීම ය.
(2) කිතු දහම පැතිරවීමට රජයේ ආධාර ලැබීම ය.
(3) සෑම කෙනකුටම තමා කැමති ආගමක් ඇදහීමට නිදහස ලැබීම ය.
(4) ක්‍රිස්තියානි දේවස්ථාන ගොඩනැගීමට අවසර ලැබීම ය.
(5) රෝම ඇදහිලි හා ක්‍රිස්තියානි ඇදහිලි තවතාවයකට පත්වීම ය. (.........)

1.12 ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේ සමග එක ම භවත්වයෙන් වසන බව තීරණය කරන ලද්දේ
(1) නිසියානු මන්ත්‍රණ සභාවේ දී ය. (2) ජෙරුසලෙම් මන්ත්‍රණ සභාවේ දී ය.
(3) කැල්සිඩොන් මන්ත්‍රණ සභාවේ දී ය. (4) I වතිකානු මන්ත්‍රණ සභාවේ දී ය.
(5) එපීසියේ මන්ත්‍රණ සභාවේ දී ය. (.........)

1.13 ක්‍රිස්තියානි ධර්මය අන්‍ය ජාතිකයන් අතර ප්‍රචලිත වීමට සාධක වූයේ,
(1) අපෝස්තුලුවරුන්ගේ කැපවුණු සේවය නිසා ය.
(2) ජුදා ජාතිකයින් සුභාරංචිය ප්‍රතික්ෂේප කළ නිසා ය.
(3) අපෝස්තුලුවරුන්ගේ දූත ගමන් නිසා ය.
(4) කිතුණු ජනපදවලට යවන ලද සංදේශ නිසා ය.
(5) ප්‍රේරිතයන්ගේ චතුර දේශනා ශෛලිය නිසා ය. (.........)

1.14 "කිතුණු සභා පියෙක් වූ ...................................... තුමා කිතුණු දර්ශනිකයකු වූ අතර සභා පියෙක් වූ ශුද්ධ වූ ජෙරොම්තුමා කිතුණු ලේඛකයෙකි." හිස්තැනට වඩාත් යෝග්‍ය පිළිතුර වනුයේ කුමක් ද?
(1) අතනාසියස් (2) අගුස්තීනු
(3) ජස්ටින් (4) ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල්
(5) ඉරනේයස් (.........)

1.15 ජෝන් කැල්වින්ගේ රෙප්‍රමාදු දහම ශ්‍රී ලංකාවේ ප්‍රචාරය කිරීමට .......................... වෙහෙස ගත්හ. මෙම හිස් තැනට යෝග්‍ය වන්නේ කුමක් ද?
(1) පෘතුගීසීන් (2) ඉංග්‍රීසීන්
(3) යුරෝපීයයන් (4) ඇමෙරිකානුවන්
(5) ලන්දේසීන් (.........)

1.16 ලන්දේසි ධර්මදූත ව්‍යාපාරයේ කේන්ද්‍රස්ථානය වූයේ
(1) රදගුරු වසම ය. (2) නගරය ය.
(3) ගම ය. (4) පාසල ය.
(5) පල්ලිය ය. (.........)

The National e-learning Portal for the General Education

[ තුන්වෙනි පිටුව බලන්න.

1.17 ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු කතෝලික අධ්‍යාපනයේ ඇති වූ ඓතිහාසික සිදුවීමකි,
(1) මිෂනාරි ධර්මදූතවරුන් රටෙන් පිටුවහල් කිරීම
(2) කතෝලික පාසල් රජයට පවරා ගැනීම
(3) ඇමෙරිකන් ධර්මදූතවරුන්ගේ සේවාවන් ව්‍යාප්ත වීම
(4) දේශීයකරණය කෙරෙහි සභාව නැඹුරු වීම
(5) ඉංග්‍රීසි භාෂාව ප්‍රචලිත වීම (.........)

1.18 ඔරතෝරියානු පියවරුන්ගේ ධර්ම දූත සේවයේ කැපීපෙනෙන ලක්ෂණයක් වූයේ,
(1) මිනිසුන් සමඟ සුහදව කටයුතු කිරීම
(2) අනෙකුත් ආගම්වලට ගෞරවය දැක්වීම
(3) දැඩි ජ්වලිත කමකින් ධර්මය ප්‍රචාරය කිරීම
(4) ආගමික පොත පත මුද්‍රණය කිරීම
(5) නාට්‍ය හා සංගීතය ආදි කලා මාධ්‍යයන්ට නැඹුරු වීම (.........)

1.19 මහනුවර රාජධානිය දැඩි නියඟයෙන් පීඩා විඳින කළ වැසි වස්වා දෙන ලෙස භාග්‍යවත් වූ ජුසේ වාස් පියතුමාට ආයාචනා කළ රජතුමා වූයේ,
(1) ශ්‍රී නරේන්ද්‍ර සිංහ රජතුමා ය.
(2) දෙවන රාජසිංහ රජතුමා ය.
(3) විමලධර්මසූරිය රජතුමා ය.
(4) දෙන් ජුවන් ධර්මපාල රජතුමා ය.
(5) සංකිලි රජ ය. (.........)

1.20 තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරයා ලක් ඉතිහාසයේ කැපී පෙනෙන බ්‍රිතාන්‍ය පාලකයකු වනුයේ,
(1) කතෝලිකයනට පනවා තිබූ ආගමික තහංචි ඉවත් කිරීම නිසා ය.
(2) ලාංකියන්ගේ අභිමානය නගාසිටු වූ නිසා ය.
(3) බදු බරින් නිදහස් කළ නිසා ය.
(4) අන්තර් ආගමික බැඳීම් වැඩි දියුණු කළ නිසා ය.
(5) දේවස්ථාන ගොඩනැඟීමට අවසර දුන් නිසා ය. (.........)

*(ලකුණු 1 × 20 = 20 යි)*

* *

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

**ක්‍රිස්තු ධර්මය II**
**சிறிஸ்தவம் II**
**Christianity II**

※ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## II කොටස

**2.** (අ) "මිනිස් ප්‍රයත්නය හුදෙක් පෞද්ගලිකත්වය සඳහා නොව සාමූහික සහජීවනය සඳහා ය." මෙම කියමන "වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව" නමැති ප්‍රකාශනය ඇසුරෙන් **පේළි 15 කින්** පමණ විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

(ආ) "සාමූහික සහජීවනය" ඔබ ජීවත්වන සමාජය තුළ වර්ධනය කිරීම සඳහා ඔබ ගන්නා පියවර **පහක්** පෙන්වා දෙන්න. *(ලකුණු 10 යි)*

**3.** (අ) මෝසෙස්තුමාගේ ව්‍යවස්ථාව පිළිබඳ ශුද්ධ වූ පාවුළු තුමාගේ දැක්ම රෝම ලිපිය ඇසුරෙන් කරුණු **පහක්** ඉදිරිපත් කරමින් පහදන්න. *(ලකුණු 10 යි)*

(ආ) "ඔබ දේවානුභාවයෙන් පටන් ගෙන පිටස්තර චාරිත්‍රයකින් ගැලවීම ලබන්න සිතන්නහු ද?" මෙලෙසින් ගලාතිවරුන්ගේ ඇදහිල්ල අභියෝගයට ලක් කරන ශුද්ධ වූ පාවුළුතුමාගේ ඉගැන්වීම පදනම් කරගෙන නූතන ලාංකික කිතුණුවා තම ඇදහිල්ලට එරෙහිව එල්ල ගෙන ඇති මිත්‍යා විශ්වාසයන් පිළිබඳ **පේළි 15 කින්** පමණ විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

**4.** (අ) 1 කොරින්ති 12 වන පරිච්ඡේදයේ ශුද්ධ වූ පාවුළුතුමා ශුද්ධ වූ සභාව මිනිස් සිරුරට සමාන කරමින් උගන්වන පණිවිඩය **පේළි 15 කින්** පමණ ඉදිරිපත් කරන්න. *(ලකුණු 10 යි)*

(ආ) ශුද්ධ වූ පාවුළු තුමා 1 කොරින්ති 12 ලිපියෙන් ප්‍රකාශ කරන ඉගැන්වීම ඔබ මීසම තුළ ක්‍රියාත්මක කරන අයුරු කරුණු **දහයකින්** පහද දෙන්න. *(ලකුණු 10 යි)*

**5.** (අ) ස්වාමීන් වහන්සේගේ රාත්‍රි භෝජනය නිසි ලෙස පැවැත්වීම ගැන කොරින්ති ලිපියේ (1 කොරින්ති (11:17-34) පාවුළුතුමා කරන ඉගැන්වීම් **පේළි 15 කින්** ලියා දක්වන්න. *(ලකුණු 10 යි)*

(ආ) දිව්‍ය පූජාවට සහභාගිවන ඔබ නූතන සමාජය තුළ ජීවත් විය යුතු අයුරු **වචන 100 කින්** විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

**6.** (අ) ක්‍රිස්තුස් වහන්සේගේ පරම ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ ව ශුද්ධ වූ පාවුළුතුමා කොලොස්සි (1:15-20) ලිපියෙන් මතු කරන ඉගැන්වීම් කරුණු **පහකින්** සනාථ කරන්න. *(ලකුණු 10 යි)*

(ආ) ඔබ ලබා ඇති ප්‍රසාද ස්නාපනයේ දේව ධාර්මික ගැඹුර ශුද්ධ වූ පාවුළුතුමා රෝම ලිපියේ (6:1-14) පෙන්වා දී ඇති අයුරු කරුණු **පහක්** ඉදිරිපත් කරමින් පහද දෙන්න. *(ලකුණු 10 යි)*

**7.** (අ) ක්‍රිස්තියානි ධර්මය ජෙරුසලමෙන් බැහැර ව්‍යාප්ත විමට තුඩු දුන් හේතු **පහක්** ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

(ආ) මුල් කිතුණු සභාවෙහි පැවැති ජනවන්දනා පිළිවෙත් ක්‍රම ක්‍රමයෙන් විකාශනය වූ අයුරු **වචන 100 කින්** පමණ පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

**8.** (අ) "ලෞකික වශයෙන් සභාව පීඩා විඳින විට ආධ්‍යාත්මික වශයෙන් ප්‍රබල තත්ත්වයකට පත් විය." පීඩන යුගය නිදසුන් වශයෙන් ගෙන මෙම ප්‍රකාශනය **පේළි 15 කින්** පමණ විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

(ආ) තාපස පංති බිහි වූයේ සභාවේ කාලීන අවශ්‍යතාවයක් ඉටු කිරීමට බව හේතු දක්වමින් **පේළි 15 කින්** පමණ විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

[ පස්වෙනි පිටුව බලන්න.

9. (අ) 1682 ජූලි 1 දරන ආඥා පණතින් ලන්දේසින් විසින් පනවන ලද නියෝගයනට අනුව කතෝලිකයින්ට මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා **පහක් පේළි 15 කින්** පමණ විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

(ආ) භාග්‍යවත් ජුසේවාස් පියතුමාගේ ධර්ම දූත ප්‍රතිපත්ති ශ්‍රී ලාංකීය කතෝලික සභාවට වැදගත් වූ ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

10. පහත සඳහන් මාතෘකා අතුරෙන් **හතරක්** තෝරාගෙන **පේළි 15 කින්** පමණ කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී ලාංකික නිදහස් සටනට කිතුණු සභය.

(ii) කිතුණු සභාව දේශානුරූප වීම

(iii) ලෝකය තුළ අදේව දෘෂ්ටිය ඇති වීමට හේතු (වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව ඇසුරෙන්)

(iv) අත් තැබීමේ පිළිවෙත

(v) නෙස්ටෝරියන් වෙද භේදය *(ලකුණු 5 × 4 - 20 යි)*

* * *